සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாணக் கல்வித் திணைக்களம்
**Sabaragamuwa Provincial Department of Education**

පළමුවන වාරපරීක්ෂණය - 2018 | 11 ශ්‍රේණිය
First Term Test - 2018 | Grade 11

**ව්‍යාපාර ගිණුම්කරණ අධ්‍යයනය I** | **කාලය පැය 1**
**Business and Accounting Studies I** | **One hour**

නමඃ-.................................................................................................................

සැළකිය යුතුයි.
i. සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
ii. අංක 1 සිට 40 දක්වා ප්‍රශ්න වලට දී ඇති (1) (2) (3) (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුරු තෝරා ලියන්න.
iii. ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් අංකය ට සැසඳෙන කවය තුළ X ලකුණ යොදන්න.
iv. එම පිළිතුරු පත්‍රය පිටුපස දී ඇති අනෙක් උපදෙස් සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

01. ව්‍යාපාරයක් යනු

( 1 ) භාණ්ඩ නිෂ්පාදනය හා බෙදාහැරීමේ ක්‍රියාවලියයි

( 2 ) මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කිරීමේ ඕනෑම කටයුත්තක්

( 3 ) ලාභ ලැබීමේ අරමුනින් කරනු ලබන කරනු ලබන ඕනෑම කටයුත්තක්

( 4 ) වෙළඳාම පිළිබඳ පුද්ගලයන් අතර ඇතිකර ගන්නා ගිවිසුමයි

02. සාවද්‍ය ප්‍රකාශය තෝරන්න

( 1 ) අවශ්‍යතා නිසඟයෙන් බිහිවේ. නිර්මාණය කල නොහැක

( 2 ) එක් අවශ්‍යතාවයක් සපුරා ගැනීමට විවිධ ආකාරයේ වුවමනා භාවිතා කල හැකිවේ

( 3 ) රැකියා උත්පාදනය, ලාභ අපේක්ෂිත ව්‍යාපාරවල අරමුනකි

( 4 ) ආහාර ඇඳුම් හා නිවාස පමණක් මූලික මිනිස් අවශ්‍යතා ලෙස සැලකේ

03. නිෂ්පාදනයේදී ආධාරකර ගන්නා මිනිසා විසින් සකස් කරන ලද දේ හඳුන්වනු ලබන්නේ.

( 1 ) ව්‍යවසාය ( 2 ) ප්‍රාග්ධනය ( 3 ) මානසික ශ්‍රමය ( 4 ) කායික ශ්‍රමය

04. බදු ආදායම් නිසිලෙස ලබා ගැනීම රැකියා අවස්ථා උත්පාදනය ජාතික නිෂ්පාදිතය වර්ධනය කර ගැනීම යන අරමුණු ඉටුකර ගත යුතු පාර්ශවයන් වන්නේ

( 1 ) අයිතිකරුවන් ( 2 ) සේවකයන්

( 3 ) රජය ( 4 ) සැපයුම්කරුවන්

05. බාහිර පරිසරයට අයත් නොවන කන්ඩායමක් නම්,

( 1 ) සේවකයන් ( 2 ) ගනුදෙනු කරුවන්

( 3 ) සැපයුම්කරුවන් ( 4 ) දේශපාලන පරිසරය

06. පහත සඳහන් පද යුගලයේ නොගැලපෙන පද යුගලය තෝරන්න?

( 1 ) ශක්තිය - කළමණාකරන අද්දැකීම්

( 2 ) දුර්වලතා - අයහපත් සේවක ආකල්ප

( 3 ) අවස්ථා - නව නගර නිර්මාණ

( 4 ) තර්ජන - තාක්ෂණ දැනුම යාවත්කාලීන නොවීම

07. විවිධ නිර්නායක මත ව්‍යාපාර සංවිධානයක පරිමානය තීරණය කෙරේ. ඒ අනුව ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්ථමේන්තුව හඳුන්වාදෙන පරිදි සේවක සංඛ්‍යාව 250 ට අඩු ව්‍යාපාර හඳුන්වනු ලබන්නේ,

( 1 ) හවුල් ව්‍යාපාර

( 2 ) සුළු හා මධ්‍ය පරිමාණණ

( 3 ) රාජ්‍ය සමාගම්

( 4 ) දෙපාර්ථමේන්තු

08. විශේෂ හෝ පොදු පාර්ලිමේන්තු පනත් මගින් ආරම්භ කර ඇති ශ්‍රී ලංකා වරාය අධිකාරිය, විදේශ සේවා නියුක්ති කාර්යාංශය ආදී ආයතන අයත් වන්නේ,

( 1 ) සමුපකාර සමිති ( 2 ) රාජ්‍ය දෙපාර්තමේන්තු

( 3 ) සංස්ථාපිත සමාගම් ( 4 ) රාජ්‍ය සංස්ථා

09. පාරිභෝගිකයා, දේශීය නිෂ්පාදකයා, හා ව්‍යාපාරික ප්‍රජාව ආරක්ෂා කිරීමට ක්‍රියාත්මක නොවන ආයතනයක් නම්,

.

( 1 ) මධ්‍යම පරිසර අධිකාරිය

( 2 ) කම්කරු විනිශ්චය සභාව

( 3 ) විවිධසෙවා සමුපකාර සමිති

( 4 ) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

10. අනු පිළිවෙලින් ගැලපූ විට වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,

( 1 ) සමුපකාර සමිති A විශේෂ පනතකින් ආරම්භ වීම

( 2 ) රාජ්‍ය සංස්ථා B නෛතික පුද්ගලභාවයන් නොමැතිවීම

( 3 ) සංස්ථාපිත සමාගම් C ප්‍රජාතන්ත්‍රවාදී පාලනය

( 4 ) හවුල් ව්‍යාපාර D වගකීම සීමිතවීම

( 1 ) 1- A, 2 – B, 3 – C, 4 - D

( 2 ) 1 – B, 2 – D, 3 – A, 4 - C

( 3 ) 1 – D, 2 – C, 3 – B, 4 - A

( 4 ) 1 – C, 2 – A, 3 – D, 4 - B

11. සිල්ලර වෙළදාමේ ලක්ෂණයක් නොවන්නේ.

( 1 ) පාරිභෝගිකයාට සමීප වීම

( 2 ) සාපේක්ෂව ඒකකයක විකුණුම් මිල අඩුවීම

( 3 ) අවසාන පාරිභෝජනය සඳහා භාණ්ඩ අලෙවිය

( 4 ) භාණ්ඩ වර්ග රාශියක් ඉදිරිපත්වීම

12. මැද පෙරදිග බණිජතෙල් මිලට ගැනීම, ජපානයෙන් මෝටර් රතයක් මිලදී ගැනීම අයත් වන්නේ,

( 1 ) අපනයනය ( 2 ) ප්‍රති ආනයනය

( 3 ) ආනයනය ( 4 ) තොග වෙළදාම

13. කේවල ස්වාමි ව්‍යාපාර හා හවුල් ව්‍යාපාර වල දැකිය නොහැකි එහෙත් සීමිත සමාගම් වල දකිය හැකි ලක්ෂණයක් වනුයේ,

( 1 ) ආර්ථික කටයුත්තක යෙදීම ( 2 ) ලාභ ලැබීම

( 3 ) පැවැත්මක් තිබීම ( 4 ) නෛතින පුද්ගලභාවයක් තිබීම

14. විශාල වශයෙන් මුදලක් අත නොමැති නීති රීති බැඳුම් වලට අකමැති ස්වාධීනව ව්‍යාපාර කටයුතු කිරීමට කැමති වනිගසූරිය මහතාට ආරම්භ කිරීමට සුදුසු ව්‍යාපාර සංවිධාන වර්ගය වනුයේ,

( 1 ) සීමිත සමාගම් ( 2 ) තනි පුද්ගල ව්‍යාපාර

( 3 ) හවුල් ව්‍යාපාර ( 4 ) සමිති සංවිධාන

15. ව්‍යාපාර සංවිධාන ලියාපදිංචි කිරීමේ දී ඉදිරිපත්කල යුතු ලියවිලි අතර සාමාජික මුදල් පරිහරණය පිළිබඳ වාර්තාවක් අවශ්‍ය වනුයේ කුමන ව්‍යාපාර සංවිධානයටද?

( 1 ) සංස්ථාපිත සමාගම් ( 2 ) සමිති සංවිධාන

( 3 ) සමුපකාර සමිති ( 4 ) හවුල් ව්‍යාපාර

16. බැංකුව විසින් තැන්පතු සඳහා ලබාදෙන පොලී අනුපාතය මත රටක ඉතිරි කිරීම තීරණය වේ. මෙම ප්‍රකාශයෙන් හැඟවෙන ව්‍යාපාර පරිසර සාධකය වනුයේ.

( 1 ) ප්‍රජා පරිසරය ( 2 ) ආර්ථික පරිසරය

( 3 ) දේශපාලන පරිසරය ( 4 ) සමාජ හා සංස්කෘතික පරිසරය

17. සන්නිවේදනය යනු,

( 1 ) එක් ස්ථානයක ඇති තොරතුරු තවත් ස්ථානයකට ලබාදීම

( 2 ) දත්ත රක් රැස් කර තොරතුරු බවට පත් කිරීම

( 3 ) සියළුම කරුණු එක් ස්ථානයකට රැස් කිරීමයි

( 4 ) දත්ත පරිගණකය මගින් සකස් කිරීමයි

18. පහත දැක්වෙන්නේ සන්නිවේදන ක්‍රම කිහිපයකි.

| සන්නිවේදන මාධ්‍යය | සන්නිවේදන ක්‍රමය |
|---|---|
| ( 1 ) වාචික | A – වාර්තා |
| ( 2 ) ලිඛිත | B - ගුවන් විදුලිය |
| ( 3 ) විද්‍යුත් | C – වැඩමුළු |

නිවරදි අනුපිළිවෙල ගැලපූවිට පිළිතුර වනුයේ

( 1 ) C, B, A ( 2 ) A, B, C ( 3 ) C, A, B ( 4 ) B, A, C

19. වාණිජ බැංකුවකින් අයිරා පහසුකම ලබාගත හැක්කේ,

( 1 ) ඕනෑම ගිණුම් හිමියකුට ( 2 ) ඉතුරුම් ගිණුම් හිමියකුට

( 3 ) ජංගම ගිණුම් හිමියකුට ( 4 ) ස්ථාවර ගිණුම් හිමියකුට

20. පහත සඳහන් ප්‍රකාශ අතරින් නිවරදි ප්‍රකාශය වන්නේ,

( 1 ) චෙක්පතක අන ලද්දා සෑමවිටම වාණිජ බැංකුවකි

( 2 ) රේකනය කරන ලද චෙක්පතකට බැංකු කවුන්ටරයෙන් මුදල් ලබාගත හැක

( 3 ) චෙක්පත් මගින් ගෙවීම් කිරීමට බැංකු ජංගම ගිණුමක් අවශ්‍ය නොවේ

( 4 ) චෙක්පත් රේඛණය කල හැක්කේ අණ ලද්දාට පමණි

21. රක්ෂිතයාට රක්ෂණ සමාගමෙන් හැර වෙනත් පාර්ශව වලින් වන්දි ලබා ගැනීම වලක්වන රක්ෂණ මූලධර්මය කුමක්ද?

( 1 ) උපරිම විස්වාසය ( 2 ) හානිපූරණය ( 3 ) දායකත්වය ( 4 ) ආදේශනය

22. මාර්ගය, මාධ්‍ය, බලය, පර්යන්තය යන ප්‍රවාහනයේ මූලිකාංග සඳහා නිදසුන බැගින් දැක්වෙන පිළිතුර වන්නේ

( 1 ) බස් නැවතුම්පොළ, මහා මාර්ගය, ගෑස්, විදුලිය

( 2 ) ගුවන් මාර්ග, ගුවන් යානා, ඛණිජතෙල්, ගුවන් තොටුපල

( 3 ) විදුලිය, දුම්රිය, ගෑස්, දුම්රිය නැවතුම්පොළ

(4 ) ගුවන් මාර්ග, විදුලිය, ගෑස්, දුම්රිය

23. වැඩිවීම හර අඩුවීම බැර මූලධර්මය ගැලපෙන්නේ,

( 1 ) වත්කම් හා වගකීම්

( 2 ) වත්කම් හා වියදම්

( 3 ) හිමිකම් හා ආදායම්

(4 ) වත්කම් හා ආදායම්

24. ව්‍යාපාරයක ජංගම වත්කම් පමණක් ඇතුලත් ඛාණ්ඩය වනුයේ,

( 1 ) තොගය, ණය ගැතියෝ, යන්ත්‍ර , මුදල්

( 2 ) තොගය, ණය ගැතියෝ, බැංකු ශේෂය, මුදල් ශේෂය

( 3 ) තොගය, ණය ගැතියෝ, ලීබඩු, මුදල්

(4 ) තොගය, ණය ගැතියෝ, උපකරණ, මුදල්

25. ගැනුම් ජනලයේ සටහන් කිරීමට උපයෝගී කර ගන්නා මූලාශ්‍ර ලියවිල්ල වනුයේ

( 1 ) බැරපත ( 2 ) හරපත ( 3 ) ඉන්වොයිසිය (4 ) යවුචරය

26. ව්‍යාපාරයකට මුදල් ලැබීමේදී භාවිතා කරන ලදුපත

( 1 ) මූලාශ්‍ර ලේඛණයයි ( 2 ) ජනලයකි

( 3 ) ලෙජර් ගිනුමකි (4 ) මූලික සටහන් පොතකි

27. ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා ජනහිත සමාගමෙන් ලීබඩු ණයට ගැනීම සටහන් කල යුතු මූලික ටහන් පොත වනුයේ

( 1 ) මුදල් පොතයි ( 2 ) පොදු ජ'නලයකි ( 3 ) ගැනුම් ජ'නලයකි ( 4 ) විකුණුම් ජ'නලයකි

28. ව්‍යාපාරය සමන්තිකාට විකුණනලද භාණ්ඩ වලින් රු 4000 වටිනා භාණ්ඩ ආපසු හරවා එවන ලදී. මෙය සටහන් කිරීමට අවශ්‍ය මූලාශ්‍ර ලේඛණය වනුයේ,

( 1 ) ඉන්වොයිසිය ( 2 ) ලදුපොත ( 3 ) හරපත ( 4 ) බැරපත

29. 2014 ජනවාරි සුළු මුදල් භාර කරුට දුන් අග්‍රිමය වනුයේ රු 3500 ක්. මාසය අවසානයේ පැවත් සළු මුදල් වශයෙන් අත ඉතිරි ශේෂය වනුයේ රු 250 කි. ඉදිරි මාසය සඳහා සුළු මුදල් වශයෙන් ප්‍රති පූරණය කල යුතු වන්නේ,

30. ගිණුම් කරණ සමීකරණය සම්න්ධ නිවරදි ප්‍රකාශය තෝරන්න

( 1 ) පවතින විට වත්කම් වල වටිනාකම වගකීම් වලට සමාන වේ.

( 2 ) අයිතිකරුගේ ප්‍රාග්ධනයෙන් වගකීම් අඩුකල පසු ලැබෙන වටිනාකම ව්‍යාපාරයේ වත්කම් වලට සමාන වේ.

( 3 ) බැංකු ණයක් ලබාගෙන ඇති විට වත්කම්වල වටිනාකම අයිතිකරුගේ ප්‍රාග්ධනයට සමාන වේ.

(4 ) වත්කම්වල වටිනාකමෙන් වගකීම්වල වටිනාකම අඩුකල පසු අගය අයිතිකරුගේ ප්‍රාග්ධනය වේ.

31. ව්‍යාපාරයක සියළුම ගිණුම් ඇතුලත් කර ඇති ලේඛණය වනුයේ,

( 1 ) මූලික පොත ( 2 ) ලෙජරය ( 3 ) ජනලය (4 ) මුදල් පොත

ජනකගේ ව්‍යාපාරයේ 2017 12 31 දිනට පිළියෙල මුදල් පොතේ බැංකු තීරුවල ශේෂය රු 7000 කි. එදිනට ලද බැංකු ප්‍රකාශනයේ ශේෂය මෙයට වෙනස් විය. වෙනසය හේතු පහත දැක්වේ.

- සෘජු ප්‍රේෂණ රු 4000 කි, ස්ථාවර නියෝග ගෙවීම් රු 2000 කි
- තැම්පත් කල උපලබ්දි නොවූ චෙක්පත් වල වටිනාකම රු 8000 කි

32. ඉහත තාරතුරු වලට අනුව මුදල් පොතේ සංශෝධිත ශේෂය,

( 1 ) රු 7000 කි ( 2 ) රු 15000 කි ( 3 ) රු 9000 කි (4 ) රු 11000 කි

33. බැංකු සැසදුම් ප්‍රකාශයේ ශේෂය

( 1 ) රු 8000 කි ( 2 ) රු 9000 කි ( 3 ) රු 7000 කි (4 ) රු 1000 කි

34. නාමල් හදිසියේ මියයාම හේතුවෙන් ඔහුගෙන් ලැබීමට තිබූ රු 12750 ක ණය මුදල පොත් වලින් කපා හරින ලදී. එය ගිණුම් ගත කිරීමට අදාල නිවරදි ද්විත්ව සටහන වන්නේ

( 1 ) ණයහිමි ගිණුම හර ගැනුම් ගිණුම බැර

( 2 ) නාමල්ගේ ගිණුම හර මුදල් ගිණුම බැර

( 3 ) බොල්ණය ගිණුම හර ණයහිමි ගිණුම බැර

( 4 ) බොල්ණය ගිණුම හර නාමල්ගේ ගිණුම බැර

35. 2017 3 31 දින ව්‍යාපාරිකයාගේ බැංකු ගිණුමේ හර ශේෂය රු 5000 කි. එදිනට බැංකු ප්‍රකාශණය අනුව හර ශේෂය රු 5100 විය. මෙම වෙනසට හේතු වූ ගණුදෙනුව වන්නේ

( 1 ) ස්ථාවර නියෝග අනුව ගෙවූ රක්ෂණ ගාස්තුව රු 100 කි

( 2 ) ඍජු ප්‍රේශණ රු 100 ක්

( 3 ) බැංකුවට ඍජුවම ගැබී ඇති ලාභාංශ රු 100 කි

( 4 ) බැංකුවට ලැබී ඇති ආයෝජන පොළිය රු 100 කි

පහත දැක්වෙන ගිණුම්කරණ වැරදි කිහිපයකි. ඒ ඇසුරින් 36 37 හා 38 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A රු 2000 ක රක්ෂණ ගාස්තු ගෙවීම් ගිණුම් පොත්වල සටහන් වී නැත

B රු 5000 ක ලිපිද්‍රව්‍ය මිලට ගැනීම මුදල් පොතේ පමණක් සටහන් වී තිබීම

C රු 4000 ක දුන් වට්ටම 4400 ක් ලෙස ගිණුම් පොත්වල සටහන් වී තිබීම

D විකුණුම් ජනලයේ එකතුව රු 2500 කින් වැඩිවීම

E මෝටරථ අළුත්වැඩියාව සඳහා වැයකල රු 2000 ක් මෝටර් රථ ගිණුමට හර කර තිබීම

36. මේවායින් ශේෂ පිරික්සුමේ එකතුව අතර වෙනසක් ඇති නොකරන වැරදි වනුයේ

( 1 ) A, B, E ( 2 ) B, C, E ( 3 ) A, C, E (4 ) B, C, D

37. ශේෂ පිරික්සුමේ එකතුව අතර වෙනසක් ඇති කරන වැරදි වනුයේ

( 1 ) B, E ( 2 ) B, D ( 3 ) A, E (4 ) C, D

38. මෙහි දැක්වෙන E ගණුදෙනුව අයත්වන ගිණුම්කරණ දෝෂය වනුයේ

( 1 ) ඌනතා ( 2 ) අතිරික්තතා දෝෂයකි ( 3 ) මූලධර්ම දෝෂයකි (4 ) ද්විකරණ දෝෂයකි

39. වාණිජ බැංකු විසින් ණය පදනම මත ගණුදෙනු කිරීම සඳහා නිකුත් කරනු ලබන කාඩ්පත් වර්ගය

( 1 ) හරපත් ( 2 ) ණයපත් ( 3 ) SET කාඩ්පත් (4 ) PET කාඩ්පත්

40. පහත ගිණුම් අතරින් පොළී ආදායම් නොලබන ගිණුම් වර්ගය වනුයේ

( 1 ) ස්ථාවර තැම්පතු ( 2 ) ධනයෝජන ( 3 ) ඉතිරිකිරීම් (4 ) ජංගම